2021

# ග්‍රාම සංවර්ධන සැලැස්ම

විලවල-537



ප්‍රාදේශීය ලේකම් කාර්යාලය-දෙහිවල

# 537-විලවල

# ග්‍රාම සංවර්ධන සැලැස්ම




ආර්ථික සංවර්ධන නිලධාරී

පී.එච්.එදිරිසිංහ මිය

# පටුන


| | පිටු අංක |
|---|---|
| (1) හැඳින්වීම | 01 |
| (2) පිහිටීම. | 02 |
| (3) වසමේ ජනගහනය හා පවුල් සංඛ්‍යාව | 03 |
| (4) වසමට අයත් මාර්ග | 04 |
| (5) යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වන සැලැස්ම | 05-07 |
| (6) සමාජ සංවර්ධන සැලැස්ම | |
| i. වැඩිහිටියන් සමාජයෙන් හුදෙකලා වීම. | 08 |
| ii. ක්‍රීඩා පිටි සංවර්ධනය කිරිම | 09 |
| iii. වින්සර් පෙර පාසල - සංවර්ධනය කිරීම | 10 |
| iv. දහම් පාසල් සංවර්ධනය කිරීම | 10 |
| v. නිවාස ගැටලු | 11 |
| • අවිධිමත් නිවාස ඉදිකිරීම | 11 |
| • බෝධියවත්ත නිවාස යෝජනා ක්‍රමය | 11 |
| vi. සනීපාරක්ෂක පහසුකම් පිළිබඳ තොරතුරු | 12 |
| (7) ජීවනෝපාය, ව්‍යවසාය සංවර්ධන හා කාන්තා සවිබල කරන සැලැස්ම | 13 |
| (8) මත්ද්‍රව්‍ය පාලනය කිරීම | 14 |
| (9) නිපුණතා සංවර්ධන සැලැස්ම | 15 |
| (10) කෘෂිකර්ම සංවර්ධන සැලැස්ම | 16 |
| (11) පරිසර කළමනාකරණ සැලැස්ම | 17-18 |
| (12) සෞඛ්‍යය හා පෝෂණ ගැටලු | 19 |
| • දකුණු කොළඹ ශික්ෂණ රෝහල | 20 |
| (13) ළමා අපයෝජනය | 21 |
| (14) ග්‍රාම ශක්ති වැඩසටහන - විලවල | 22 |
| (15) ශ්‍රී මහා විහාරය පන්සල - යෝජනාවලිය | 23-26 |

# විලවල ග්‍රාම නිලධාරි වසම

## ග්‍රාම සංවර්ධන සැලැස්ම

### 01.හැඳින්වීම.

වර්ෂා කාලයේදි මෙම ප්‍රදේශය පුරා ගලා ගිය මහ ජල කඳ හේතුවෙන් විවිධ ස්ථානවල විල් හා වළවල් බොහෝමයක් ඇතිවිය. විල් හා වළවල් වලින් ගහණ වූ බැවින් මෙම ප්‍රදේශය "විලවල"ලෙස හැඳින්වූ බවට පැරැණ්නන් අතර මතයක් පවතී. විලවල ග්‍රාම නිලධාරී වසම වර්ග කිලෝමීටර් 0.75 (හෙක්ටයාර් 57.5) පුරා විහිදී පවතී.

අධි නාගරික ප්‍රදේශයක් වන විලවල ග්‍රාම නිලධාරී වසම තුළ පවුල් 1795ක් පමණ ජීවත් වන අතරම ජනගහනය ලෙස 6754ක් පෙන්වා දිය හැකිය. නිවාස 1600ක් තුළ සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් යන සියලු ජාතීන් විවිධ සංස්කෘතීන් නියෝජනය කරමින් විවිධ සංස්කෘතික ලක්ෂණ වලින් සමන්විතව ඉතා සහයෝගයෙන් තම තමන්ගේ විවිධ ආගම් අදහමින් මෙම වසම තුළ සහජීවනයෙන් ජීවත් වෙති.


සමාජ පසුබිම ලෙස කෙටියෙන් ගත් කළ විවිධ වෘත්තීන්හි නියැලෙන පුද්ගලයන් මෙන්ම විවිධ සමාජ ස්ථරවල ජීවත්වන විවිධත්වයකින් යුතු සමාජ පද්ධතියන් "විලවල" තුළින් හඳුනා ගත හැකිය. ඉහළ ධනපති පංතියේ සිට දිළිඳු පුද්ගලයන් දක්වා වසමේ වපසරිය වෙන් වි ඇත. ස්වයං රැකියා වලින් යැපෙන හා දෛනිකව ආදායම් උත්පාදන ක්‍රියාවලියේ යෙදෙන පවුල් විශාල ප්‍රමාණයක් විලවල තුළ ජීවත් වෙති.

වසම තුළ පිහිටා ඇති ප්‍රධාන රාජ්‍ය ආයතන ලෙස කොළඹ ජාතික රෝහලට පමණක් දෙවැනි වන දකුණු කොළඹ ශික්ෂණ රෝහල (කළුබෝවිල රෝහල) පෙන්වා දිය හැකිය. ජාතික ශිෂ්‍යභට බලකා මූලස්ථානය(National Cadet Corps) දකුණු කොළඹ ශික්ෂණ රෝහලේ පිහිටි තැපැල් කාර්යාලය, විලවල ළමා හා මාතෘ සායනය, කිරුළපන ග්‍රාමීය බැංකුව, වින්සර් පෙර පාසල රාජ්‍ය අංශය නියෝජනය කරයි. ප්‍රජා ශාලා දෙකක් (02), පොදු නාන ළිං තුනක් (03), ක්‍රීඩා පිටියක් විලවල තුළ දක්නට ලැබෙන අතර පරිවාස හා ළමාරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ පවත්වා ගෙන යන ළමා සංවර්ධන මධ්‍යස්ථානයක්ද වසම තුළ පිහිටා ඇත. කෝට්ටේ VI වන පරාක්‍රමබාහු රජතුමා විසින් කරවන ලදැයි සැලකෙන පාමංකඩ ශ්‍රී මහා විහාරය ලංකාවේ ශ්‍රේෂ්ඨ සංඝයා වහන්සේ නමක් වූ පූජ්‍ය තොටගම ශ්‍රී වාචිස්සර හිමියන්ට සෙවණ වූ බව ශ්‍රී ලංකා වාසීන්ටම නොරහසකි. එමෙන්ම ඓතිහාසික වශයෙන් වැදගත්කමක් ඇති පාමංකඩ ශ්‍රී මහා විහාරය මෙන්ම පාමංකඩ ගංගාරාම විහාරය විලවල වසම තුළට එක් කරන්නේ දහම් පාසල් දෙකක් හරහා දහම් දැනුමින් පිරි ළමා පරපුරකි.

වසම තුළ ජීවත්වන පිරිසට තම තමන්ගේ මූලික අවශ්‍යතා සපුරා ගැනිමට අවශ්‍ය ජලය, විදුලිය වැනි සම්පත් සියලු දෙනාට තිබේ.

## 02.පිහිටිම.

උතුරින් ශ්‍රී සරණංකර පාර හා සරණංකර ඇළෙන් ද නැගෙනහිරින් දුටුගැමුණු ග්‍රාම නිලධාරී වසමෙන් හා සුනන්දාරාම පාරෙන් ද දකුණෙන් ඇස්.ද.ඇස්.ජයසිංහ මාවත (රෝහල පාර) සහ හත්බෝධිය (538 බී) ග්‍රාම නිලධාරී වසමෙන්ද බටහිරින් සරණංකර (538 සී) ග්‍රාම නිලධාරි වසමෙන් ද මායිම් වී විලවල වසම පිහිටා ඇත.



## 03.වසමේ ජනගහනය හා පවුල් සංඛ්‍යාව (ස්ත්‍රී පුරුෂ භාවය අනුව)

| පවුල් සංඛ්‍යාව | ස්ත්‍රී | පුරුෂ | ජනගහනය (එකතුව) |
|---|---|---|---|
| 1795 | 3428 | 3326 | 6754 |

**ජාතීන් අනුව,**

| සිංහල | දෙමළ | මුස්ලිම් | බර්ගර් | මැලේ | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|
| 4278 | 391 | 1796 | 114 | 62 | 113 | 6754 |

**ආගම අනුව පවුල් සංඛ්‍යාව ,**

| බෞද්ධ | හින්දු | ඉස්ලාම් | කතෝලික | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|
| 1079 | 52 | 432 | 123 | 109 | 1795 |

ඡන්ද හිමි නාමලේඛණය අනුව,

| ස්ථිර පදිංචි පවුල් සංඛ්‍යාව | කුළී පදනම මත පදිංචි පවුල් සංඛ්‍යාව | ඡන්දහිමි නාම ලේඛණයේ ඇතුළත් පවුල් සංඛ්‍යාව | ඡන්ද බලය හිමි ජනගහනය | වෙනත් |
|---|---|---|---|---|
| 1314 | 569 | 1795 | 6754 | 371 |

වයස් කාණ්ඩ අනුව ජනගහනය,

| අවුරුදු 05 හා 05ට අඩු | | | අවු. 06 – 18 අතර | | | අවු. 18ට අඩු |
|---|---|---|---|---|---|---|
| ස්ත්‍රී | පුරුෂ | එකතුව | ස්ත්‍රී | පුරුෂ | එකතුව | එකතුව |
| 259 | 249 | 508 | 763 | 725 | 1488 | 1996 |

| අවුරුදු 19 – 60 අතර | | | අවු. 60ට වැඩි | | | අවු. 18ට වැඩි ජනගහනය |
|---|---|---|---|---|---|---|
| ස්ත්‍රී | පුරුෂ | එකතුව | ස්ත්‍රී | පුරුෂ | එකතුව | එකතුව |
| 1734 | 1703 | 3437 | 672 | 649 | 1321 | 4758 |

## 04.විලවල වසමට අයත් මාර්ග

(1) ද සිල්වා පාර (අංක 01 – 55 ඔත්තේ අංක 2-38/2 දක්වා )

(2) දුටුගැමුණු වීදිය (අංක 01 සිට 103/2 හා 2-116 දක්වා )

(3) කිරුළ පාත් (අංත 2/1 සිට සියළුම ඔත්තේ )

(4) අලුත් ගල්වල පාර (අංත 55 – 67/6ඒ)

(5) ශ්‍රී මහා විහාර පාර (අංත 1-49/6 ඔත්තේ අංක හා 2 – 66/48 දක්වා)

(6) ශ්‍රී සරණංකර පාර ( අංක 01 – 49/22 දක්වා)

(7) බෝධියවත්ත පාර (අංක T – 1 සිට T124 හා TT1 හා TT5 දක්වා)

(8) සුනන්දාරාම පාර (සියලුම ඉරට්ටේ)

(9) සුජාතා මාවත (සියලුම ඔත්තේ හා ඉරට්ටේ අංක)

## 05.යටිතල පහසුකම් සංවර්ධන සඳහා වන සැලැස්ම

| | |
|---|---|
| **ගැටලුව** | මාර්ග අබලන් වීම නිසා එදිනෙදා කාර්යයන් සඳහා ගතවන කාලය වැඩි වීම හා කාර්යයන් ප්‍රමාද වීම, කාණු හා බෝක්කු අබලන් තත්ත්වයෙන් පැවතිම හේතුවෙන් වර්ෂා කාලයේදී සුළු ගංවතුර තත්ත්වයන්ද ඇතිවේ. එමෙන්ම මාර්ගවල ප්‍රමාණවත් පරිදි වාහන මාරු වීම සඳහා ඉඩකඩ ඇතිව සාදා නොමැති නිසා විශාල ගැටලුකාරී තත්ත්වයක් මතු වී ඇත. |
| **අරමුණ** | උසස් ප්‍රමිතියෙන් යුත් දීර්ඝ කාලීන පැවැත්මක් සහිත මාර්ග, කාණු, බෝක්කු, පාලම් පද්ධතියක් ඇති කිරීම මඟින් දෛනික කාර්යයන් පහසුවෙන් අවම කාල පරාසයකින් ඉටුකර ගැනීමට හැකියාව ලබාගැනීමත් පහසුවෙන් ජලය බැස යන පරිදි කාණු පද්ධතිය සකස් කිරීමෙන් ගංවතුර තත්ත්වයන් අවම කිරීමත් බලාපොරොත්තු වේ. |
| **උපාය මාර්ග** | ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංස්කෘතික නිලධාරී, දෙහි/ගල් මහ නගර සභාවේ ප්‍රධාන නාගරික ඉංජිනේරු, තාක්ෂණික නිලධාරීන්, බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ, නාගරික සංවර්ධන අධිකාරියේ තාක්ෂණික නිලධාරීන් මඟින් අබලන් මාර්ග, කාණු, බෝක්කු පරික්ෂා කර ගැළපෙන ක්‍රමවේදයක් යටතේ දිගුකාලීන පැවැත්මක් සහිත අඩු කාලයක් තුළ මාර්ග, කාණු, බෝක්කු පද්ධති සකස් කිරීම. |
| **ක්‍රියාකාරකම** | පසුපිටෙහි දක්වා ඇත. |

| සංරචකය | සංවර්ධන යෝජනාව | කාල රාමුව | දිග/පළල දළ වශයෙන් | ප්‍රතිලාභීන් ගණන | වගකීම |
|---|---|---|---|---|---|
| මාර්ග | (1) ප්‍රඥානන්ද මාවතගල් අතුරා තාර දැමීම. | මාස 03 | දිග - 200 m<br>පළල - අඩි 12 | 300 | දෙහි/ගල් ම.න.ස. |
| | (2) බොතේජු මාවත සංවර්ධනය කිරීම. (කාපට්) | මාස 03 | දිග - 400 m පමණ<br>පළල - අඩි 15 (පළල තැනින් තැනට වෙනස්වේ.) | 300 | P.R.D.A. |
| | (3) ශ්‍රී සරණංකර (ගෙවල් අට) නව නිවාස යෝජනා ක්‍රමයේ මාර්ගය කාපට් අතුරා සංවර්ධනය කිරීම. | මාස 03 | දිග - 200 m<br>පළල - අඩි 20 | 500 | P.R.D.A. |
| | (4) විලවල ශ්‍රී මහා විහාර පාරේ වින්සර් පාර්ක් මාර්ගය සංවර්ධනය කිරීම. (කාපට්) | මාස 03 | දිග - 200 m<br>පළල - අඩි 20 | 500 | P.R.D.A. |
| | (5) ද සිල්වා පාර අංක 23/8 ඒ අතුරු මාර්ගය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීම. | මාස 03 | දිග - 75 m<br>පළල - අඩි 12 | 50 | දෙහි/ගල් ම.න.ස. |
| | (6) කළුබෝවිල සුනන්දාරාම පාර ව.අ. 14/2 සිට ආරම්භ වන අතුරු මාර්ගය කාපට් කිරීම. | මාස 03 | දිග - 200 m<br>පළල - අඩි 20 | 50 | P.R.D.A. |
| කාණු | (1) ද සිල්වා හරස් පාරේ කාණුවේ සංවර්ධනය නොකළ මැද කොටස සංවර්ධනය කිරීම. | මාස 03 | දිග - 50 m<br>පළල - අඩි 2 පමණ | 300 | දෙහි/ගල් ම.න.ස. |
| | (2) සුජාතා මාවතේ (ශ්‍රී මහා විහාර පාර දෙසින්) ආරම්භයේ සිට ඇති අබලන් කාණුව කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරිම. | මාස 03 | දිග - 200 m<br>පළල - අඩි 2 පමණ | 500 | දෙහි/ගල් ම.න.ස. |
| | (3) ශ්‍රී මහා විහාර පාරේග්‍රාම නිලධාරී කාර්යාලය අසල සිට ඉහළට ඇති කාණු පද්ධතිය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීම. | මාස 03 | දිග - 150 m<br>පළල - අඩි 2 පමණ | 600 | දෙහි/ගල් ම.න.ස. |

| | | | | | |
|---|---|---|---|---|---|
| කාණු | (4) විලවල මේධානන්ද පාරේ වැසි ජල කාණුව නිසි ලෙස ජලය බැස යන පරිදි කොන්ක්‍රීට් යොදා ප්‍රතිසංස්කරණය කිරීම. | මාස 03 | දිග - 50 m පළල - අඩි 12 | 150 | දෙහි/ගල් ම.න.ස. |
| | (5) බෝධියවත්ත ප්‍රදේශයේ ඇති සියලුම කාණු සඳහා කොන්ක්‍රීට් ආවරණ යෙදීම.(මෙමගින් පටු මාර්ග පළල් කර භාවිතා කිරීමට ද හැක) | මාස 03 | දිග - 200 m පමණ | 400 | දෙහි/ගල් ම.න.ස. |
| | (6) දුටුගැමුණු වීදිය අංක 58 නිවාසය ඉදිරිපස ඇති කාණුව ගැඹුරු කර කොන්ක්‍රීට් යොදා ප්‍රතිසංස්කරණය කිරීම. | මාස 03 | දිග - 200 m පමණ පළල - අඩි 2 පමණ | 500 | දෙහි/ගල් ම.න.ස. |
| බෝක්කු | ශ්‍රී සරණංකර පාරේ මුං ඇට බෝක්කුව (ගේබියන් වෝල් දමා ) පළල් කර සංවර්ධනය කිරීම. | මාස 06 | දිග - 200 m පමණ පළල - අඩි 8, අඩි 10, අඩි 12 | 600 | දෙහි/ගල් ම.න.ස. |

**විශේෂ සංවර්ධන යෝජනා**

(1) දුටුගැමුණු වීදිය අංක 37/1 බී නිවස ජලයෙන් යටවීම වැළැක්වීමට ජලය බැස යාමට ක්‍රමවේදයක් සකස් කිරීම.

(2) කළුබෝවිල ද සිල්වා හරස් පාර අංක 30/22 වංගුවට විදුලි කණුවක් සවිකිරීම.

(3) විලවල ග්‍රාම සංවර්ධන සමිතිය සඳහා කැනපි හට් 01 ( දිග අඩි 20 පළල අඩි 10) හා ඇඳි රහිත ප්ලාස්ටික් පුටු 100 ලබාදීම.

(4) විලවල දේවපුර ප්‍රජාශාලාව ප්‍රතිසංස්කරණය කිරීම හා පුටු 50ක් ලබාදීම.

(5) බෝධියවත්ත වින්සර් උද්‍යානයේ පිහිටි ප්‍රජාශාලාවේ දෙවන මහල ඉදිකිරීම.

(6) බෝධියවත්ත ප්‍රදේශයේ ඇති පන්සල ප්‍රතිසංස්කරණය කර එහි වහලය අලුතින් සකස් කිරීම.

## 06.සමාජ සංවර්ධන සැලැස්ම

i. වැඩිහිටියන් සමාජයෙන් හුදෙකලා වීම.

| | |
|---|---|
| ගැටලුව | වැඩිහිටියන් සමාජයෙන් හුදකලාවීම විශාල සමාජ ගැටලුවක් ලෙස දැකිය හැකිය. බොහෝ අවස්ථාවලදී විශ්‍රාම ගැනීමෙන් අනතුරුව දූ දරුවන් විවාහ කර දුන් පසු සමහර දරුවන් දෙමාපියන්ගෙන් ඈත් වී වාසය කරති. තවත් පිරිසක් වැඩි අධ්‍යාපනය හෝ ආර්ථිකය ඉහළ නංවා ගැනීමේ අරමුණින් විදේශගතව සේවය කරනු ලබති. එහිදි ඔවුන්ගේ දරුවන්ද විදේශ රටවලම උපත ලබා අධ්‍යාපනය හදාරා ජීවත් වෙති. මෙවැනි පවුල්වල මාපියවරුන්ට සමහරවිට තනිව විශ්‍රාම ගැනීමෙන් අනතුරුව තම ජීවිතය ගත කිරිමට සිදුවේ. එක්කෝ දූ දරුවන් බොහෝ දුරින් ජීවත් වීමද මෙයට හේතුවේ. එවැනි සමාජ පසුබිමක් බොහෝවිට මධ්‍යම පාංතික හා ධනවත් පවුල්වල දක්නට ලැබේ. මෙහෙකරුවන් තම මාපියන්ගේ වැඩවලට තබා විදේශ ගත වී හෝ වෙනම ජීවත්වන දරුවන් බොහෝ සේ දක්නට ලැබේ.<br><br>එසේම තනිවම මෙහෙකරුවෙක් සමඟ ජීවත්වන මවක් හෝ පියෙක් මෙවැනි නිවාසවල හුදෙකලාව ජීවත්වුණු දක්නට තිබේ. ඔවුන්ගේ සැදැසමයට රෝගී බවත්,සමාජයෙන් වෙන් වී බිත්ති හතරකට සිර වී සිටීමත් නිසා මානසික අවපීඩන, ආතති තත්ත්වයන් වියපත් මාපියන් තුළ දක්නට ලැබේ. කෙතරම් මුදල් තිබුණත් තමන්ගේ දරුවකුගේ හෝ හඩ ඇසීමට බැලීමට නොහැකිව අසල්වාසීන් ආශ්‍රය කිරීමට නොහැකිව ජීවත්වන දෙමාපියන් බොහෝ පිරිසක් අද වන විට සමාජය පුරා විහිදී සිටී. |
| උපාය මාර්ග | වැඩිහිටි ප්‍රජාව සවිබලකර සමාජ ක්‍රියාකාරිත්වය සඳහා ඔවුන්ගේ දැනුම, ජීවන අත්දැකීම් සමඟ මුසු කිරීමට හැකි නම් තරුණ පරපුර හා සම්බන්ධ කරගෙන වැඩසටහන් ආරම්භ කර ඒ සඳහා වැඩිහිටි ප්‍රජාව යොමුකර ගැනීම. |
| ක්‍රියාකාරකම | වැඩිහිටියන් සඳහා වැඩිහිටි සමිති/ සමාගම්වලට සම්බන්ධ කර ගෙන ඒ තුළින් සුහද හමු, සමාජ සේවා කටයුතු සඳහා නැඹුරු කරගෙන ඔවුන්ගේ හැකියාවන් සඳහා අවස්ථාවන් ලබාදීම මඟින් හුදෙකලා වීමෙන් වලක්වා ගතහැකිය. තවද කාලය ගෙවා දැමීම සඳහා ස්වයං රැකියා සඳහා ද ඔවුන් යොමුකර ආර්ථික ප්‍රතිලාභ අත්පත් කරදීමට රුකුලක් ලබා දී විනෝද චාරිකා වැනි දේ සඳහා ස්වේච්ඡාවෙන් යොමුකර ඔවුන්ගේ හැකියාවන්ට අවස්ථාවක් ලබා දී කුඩා දරුවන් සමඟ එකතු කර ඔවුන්ගේ දැනුම තරුණ ප්‍රජාව අතර බෙදා දීමට වැඩසටහන් සකස් කර ඔවුන් නිරන්තරයෙන් සමාජය හමුවේ පෙනී සිටීමට අවස්ථාව ලබා දී සක්‍රියව දායක කරගෙන මානසික නිරෝගී බව සඳහා ඔවුන්ගේ අධ්‍යාත්මික ගුණ වගාවන් වැඩි දියුණු කරගැනීමට ආගමික ස්ථාන වෙත යොමු කිරීමේ වැඩපිළිවෙලක් සකස් කිරීමත් වැඩිහිටි සමිති හරහා වෛද්‍ය සායන පැවැත්වීම මඟින් කායික නිරෝගීභාවය ඇති කරගැනිමට අවස්ථාව ලබාදී ඇතිවිය හැකි මානසික ආතතිය අවම කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම මඟින් නිවාසවලට හුදෙකලා වන වැඩිහිටි ප්‍රජාව මඟින් සමාජ සංවර්ධනය අවස්ථාවන් ලබාගත හැකිය. |
| ප්‍රතිලාභීන් ගණන | අවු.60 ට වැඩි ජනගහනය (1321) |
| වගකීම | ග්‍රාම නිලධාරීන්,පළාත් සභා හා මධ්‍යම රජයේ සමාජ සේවා නිලධාරීන් |

## ii.ක්‍රීඩා පිටි සංවර්ධනය කිරීම.

| | |
|---|---|
| ගැටලුව | විශාල ජනගහනයක් ජීවත්වන බෝධියවත්ත ප්‍රදේශයේ ඔවුන්ගේ ක්‍රීඩා කටයුතු සඳහා ඇති ක්‍රීඩාංගනය වැඩිදියුණු කළයුතු වීම හා ආරක්ෂිත දැලක් ක්‍රීඩාංගණය වටා සම්පූර්ණයෙන් නොමැතිවීමෙන් ආසන්න පිහිටි නිවාසවලට බලපෑමක් සිදුවේ. එසේම ක්‍රීඩාංගණය තුළට පිටස්තර පුද්ගලයන් ඇතුළු වීම දක්නට ලැබෙන අතර ප්‍රදේශය තුළ බෝ නොවන රෝග ව්‍යාප්තිය වැඩියෙන් දක්නට ලැබේ. |
| අරමුණ | ඉහත සඳහන් ප්‍රදේශයේ දරුවන්ගේ මෙන්ම වැඩිහිටියන්ගේ ක්‍රීඩා කෞෂල්‍ය වැඩිදියුණු කරගැනීමට මනා රුකුලක් ලබාදීම තුළින් අංග සම්පූර්ණ පෞරුෂයක් සහිත දරුවන් සමාජ ගතකිරීමට දායක වීම හා ජාතික මට්ටමේ ක්‍රීඩකයන් බිහිකිරීමට අඩිතාලම දැමීමත් බෝනොවන රෝග ව්‍යාප්තියට හේතුවන ව්‍යායාම් මදිබවට විසඳුමක් ලබා දී රෝග ව්‍යාප්තිය අවම කර වැඩිහිටියන් සක්‍රීයව සමාජයේ ජීවත්වීමට අවස්ථාව ලබාදීමත්ය. |
| උපාය මාර්ග | අද වන විට කුඩා, වැඩිහිටි භේදයකින් තොරව බෝනොවන රෝග ව්‍යාප්ත වීමේ විශාල අවධානමක් ග්‍රාමීය සමාජයට සාපේක්ෂව නාගරික සමාජයේ දක්නට ලැබේ. එබැවින් එයට හේතු සාධකයක් ලෙස ශාරීරික ව්‍යායාම නොමැතිවීම පෙන්වාදීමට පුළුවනි. ඒ සම්බන්ධයෙන් ක්‍රීඩා නිලධාරී හරහා ප්‍රජාවගේ ක්‍රීඩා කෞෂල්‍ය ඉහළ නංවාලීමට නිසි ක්‍රමවේදයක් සහිත වැඩපිළිවෙලක් සකස් කර ප්‍රජාව වෙත යොමුකර නීරෝගී ප්‍රජාවක් බිහිකර ගැනීමට උපායශීලිව කටයුතු කිරීම. |
| ක්‍රියාකාරකම | * බෝධියවත්ත ක්‍රීඩාංගනය සංවර්ධනය කර එය වටා ආරක්ෂිත දැලක් ඉදිකිරීම.<br>* ක්‍රීඩා සමාජ, කායවර්ධන මධ්‍යස්ථාන වැනි ස්ථානවලට අවශ්‍ය පහසුකම් ලබාදීම.<br>* ක්‍රිඩාවන් සඳහා පුහුණු උපදේශකයෙක් ලබාදීම හා ක්‍රීඩා කඳවුරු පැවැත්වීම. |
| ප්‍රතිලාභීන් ගණන | වසමේ සියලුම පවුල් සම්බන්ධ කරගැනීම (1795) |
| වගකීම | ග්‍රාම නිලධාරි දෙහි/ගල් ම.න.ස.<br>ක්‍රිඩා නිලධාරී(ප්‍රා.ලේ.කා)<br>සංවර්ධන නිලධාරි |

## iii.වින්සර් පෙර පාසල - සංවර්ධනය කිරීම.

| | |
|---|---|
| ගැටලුව | පෙර පාසල් ළමුන්ගේ අධ්‍යාපනය හා ක්‍රීඩා කුසලතාවයන්, වර්ධනය කිරීමටත් පෝෂණය ඉහළ නංවා ගැනීමට අවශ්‍ය පහසුකම් නොමැතිවීම. |
| අරමුණ | පෙර පාසල් ළමුන්ගේ අධ්‍යාපනය ඉහළ නංවා, ක්‍රීඩාවන්ට යොමුකර පෝෂණ මට්ටම වැඩිකර මානසික හා ශාරීරික සෞඛ්‍යයෙන් පරිපූර්ණ ළමා පරපුරක් බිහිකිරීම. |
| ක්‍රියාකාරකම | වින්සර් පෙර පාසලේ ළමුන් සඳහා අවශ්‍ය උපකරණ හා අවශ්‍යතා සම්පූර්ණ කිරීම. |
| අවශ්‍යතා | * ළමයින්ගේ ආහාර ගබඩා කිරීමට ලොකු ශීතකරණයක් (එළවලු/මස්/මාළු ළමයින්ගේ ආහාර සඳහා ගබඩා කර තැබීමට)<br>* පෙර පාසලේ ඉහළ මාලයේ රෝගී වූ දරුවෙක් වෙන් කර තැබීම සඳහා කාමරයක් ඉදිකිරීම. (ගිලන් කාමරයක්)<br>* ළමයින් සඳහා ඔන්චිල්ලාවක්, රූපවාහිනී යන්ත්‍රයක්, සෙල්ලම් ගෙයක් |
| ප්‍රතිලාභීන් ගණන | ළමයි 24 |

## iv.දහම් පාසල් සංවර්ධනය කිරීම.

| | |
|---|---|
| ගැටලුව | වසම තුළ පවතින දහම් අධ්‍යාපනය ලබාදෙන දහම් පාසල් දෙක සඳහා අවශ්‍ය භෞතික සම්පත්වල අඩුවක් දක්නට ලැබීම හා සෑම ළමයෙකුම දහම් පාසල් තුළ දහම් දැනුම ලබාගැනීමට යොමු නොවීම දක්නට ලැබේ. |
| අරමුණ | දහම් පාසල් දරුවන්ට අවහය භෞතික සම්පත් ලබාදීම මඟින් දහම් දැනුම ලබාගැනීමට පැමිණෙන දරුවන්ගේ අවශයතා සපුරා දෙන අතරම සෑම ළමයෙක්ම දහම් අධ්‍යාපනයට යොමුකිරීම තුළින් රටට වැඩදායී ගුණදහමින් පරිපූර්ණ ගුණගරුක දරුවන් පිරිසක් සමාජයට මුදා හැර යහපත් මානව සමාජයක් නිර්මාණය කිරීම. |
| අවශ්‍යතාවන් | පාමංකඩ ශ්‍රී ගංගාරාම විහාරය<br>* ප්ලාස්ටික් පුටු - 100<br>* ඩෙස්ක් 30ක් පමණ<br>* ප්ලාස්ටික් කෝප්ප - 100<br>* කුඩා පැදුරු - 15<br>* විශාල පැදුරු - 05 |
| | පාමංකඩ ශ්‍රී මහා විහාරය<br>* දිග අඩි 08 හා පළල අඩි 1 ½ පමණ යකඩින් සෑදු ඩෙස්ක් - 10<br>* බංකු - 10 |
| ප්‍රතිලාභීන් ගණන | 200 |
| වගකීම | බෞද්ධ කටයුතු සමායෝජක(ප්‍රා.ලේ.කා)<br>විහාරාධිපති ස්වාමීන් වහන්සේලා<br>සර්ව ආගමික පූජකවරුන් |
| ක්‍රියාකාරකම | විහාරස්ථාන වලට අවශ්‍යය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හරහා ප්‍රජාව ආගමික වැඩසටහන් යෝජනා කර සම්බන්ධ කරගෙන බාල මහලු සියලුදෙනාගේ සහභාගිත්වයෙන් බාහිර ප්‍රජාව පන්සල වෙත යොමුකරවා ගැනිමත් පොදුවේ සර්ව ආගමික කමිටු සර්වාගමික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මඟින් ද ප්‍රජාව අතර සහජීවනයක් ඇති කිරිම මඟින් ග්‍රාම සංවර්ධනයට ඉන් ලබාගත හැක්කේ විශාල පිටුබලයකි. |

## v.නිවාස ගැටලු – අවිධිමත් නිවාස ඉදිකිරීම.

| | |
|---|---|
| ගැටලුව | අවිධිමත් ඉදිකිරීම් (සඳහා) නිසා පාරිසරික හා සාමාජීය ගැටලු ඇතිවීම. |
| අරමුණ | අවිධිමත් ඉදිකිරීම් අවම කිරීම. |
| උපාය මාර්ග<br><br>ක්‍රියාකාරකම | අවිධිමත් ඉදිකිරීම් නිසා කාණු හා මාර්ග අවහිර වීම වලක්වා ගැනීම.<br><br>විධිමත් නිවාස පද්ධතියක් ඇති කිරීම. |

## * බෝධියවත්ත ප්‍රදේශය සඳහා මහල් නිවාස ක්‍රමයක් යෝජනා කිරීම.

| | |
|---|---|
| ගැටලුව | විලවල බෝධියවත්ත ප්‍රදේශය තුළ අවිධිමත් නිවාස සමූහයක් දක්නට ලැබේ. අඩු ආදායම්ලාභී පදිංචිකරුවන් සිටින අතර ජලයෙන් යටවීම වැනි ස්වාභාවික ආපදාවන්ට ලක්වීම වැනි ගැටලුද පවතී. |
| උපාය මාර්ග | නවීන පහසුකම් සහිත මහල් නිවාස යෝජනා ක්‍රමයක් රජය හරහා ක්‍රියාත්මක කිරීම මඟින් බෝධියවත්ත ප්‍රදේශයේ ජීවත්වන පුද්ගලයන්ගේ ජීවන මට්ටම උසස් කිරීම. |
| ක්‍රියාකාරකම | * නිවාස සංවර්ධන අධිකාරිය යටතේ මහල් නිවාස පද්ධතියක් නිසි ක්‍රමවේදයක් යටතේ ඉදිකිරීම.<br><br>* දැනට ජීවත්වන නිවාසවලට වන්දි මුදලක් මුලින් ගෙවා වෙනත් ස්ථානයකට ඔවුන් යවා (තාවකාලිකව) අවසානයේ මාසිකව යමු මුදලක් ඔවුන්ට ගෙවිය හැකි පරිදි නිවාසවල හිමකාරිත්වය ලබාදීම. |
| වගකීම | නිවාස සංවර්ධන අධිකාරිය<br>දෙහි/ගල් මහනගර සභාව<br>ප්‍රා.ලේ. කාර්යාලය |
| ප්‍රතිලාභීන් ගණන | පවුල 600 පමණ |

## vi.සනීපාරක්ෂක පහසුකම් පිළිබඳ තොරතුරු

<table>
<tr><td>ගැටලුව</td><td colspan="2">සනීපාරක්ෂක පහසුකම් විධිමත් පරිදි නොමැති වීම.</td></tr>
<tr><td>අරමුණ</td><td colspan="2">විධිමත් සනිපාරක්ෂක පහසුකම් ඇතිකිරීම මඟින් යහපත් සෞඛ්‍ය පුරුදු සහිතව ජීවන රටාවකට ප්‍රජාව හුරු කරවීම හා සෞඛ්‍ය සම්පන්න ප්‍රජාවක් බිහිකිරීම.</td></tr>
<tr><td>උපාය මාර්ග</td><td colspan="2">මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරී හා දෙහි/ගල් මහ නගර සභාවේ තාක්ෂණික නිලධාරීන්, ඉංජිනේරුවන් හා දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තාක්ෂණික නිලධාරීන්ගේ උපදෙස් ලබාගෙන විධිමත් සනීපාරක්ෂක පහසුකම් නියාමනය කිරීම.</td></tr>
<tr><td>ක්‍රියාකාරකම</td><td colspan="2">පොදු ස්ථානවල වැසිකිළි ඉදිකිරීම හා ආබාධිත, වැඩිහිටි ප්‍රජාව සඳහා ඔවුන්ට යෝග්‍ය පරිදි වැසිකිළි තනාදීම හා වැසිකිළි නොමැති, අබලන් තත්ත්වයේ පවතින වැසිකිළි සඳහා ද්‍රව්‍යාධාර හා මූල්‍යාධාර සැපයීම.</td></tr>
<tr><td>වගකීම</td><td colspan="2">ප්‍රා.ලේ. කාර්යාලයේ සමෘද්ධි නිලධාරී/ සංවර්ධන නිලධාරී හා සමාජ සේවා නිලධාරී</td></tr>
<tr><td>ප්‍රතිලාභීන්</td><td><u>නම</u><br><br>(1) ආර්.කරුණාවතී<br>(2) කුසුමාවතී දාබරේ<br><br><br><br>(3) ජේ.පි.සි.රත්නමාලි<br><br>(4) එච්.ඒ.සරෝජනී</td><td><u>ලිපිනය</u><br><br>අංක 29/84, බෝධියවත්ත,දෙහිවල.<br>අංක 29/113, බෝධියවත්ත,දෙහිවල.<br>(ආබාධිත සහෝදරයා වෙනුවෙන් සම්පූර්ණයෙන්ම සාදා දිය යුතුය.)<br><br>අංක 29/84 ඒ, බෝධියවත්ත,දෙහිවල.<br><br>අංක 29/89 එෆ්, බෝධියවත්ත,දෙහිවල.<br>( වැසිකිලියක් සම්පූර්ණයෙන්ම සාදා දිය යුතු නමුත් පවතින ඉඩකඩ ප්‍රමාණවත් නොවේ.)</td></tr>
</table>

## 07.ජීවනෝපාය, ව්‍යවසාය සංවර්ධන හා කාන්තා සවිබල කරන සැලැස්ම.

| | |
|---|---|
| ගැටලුව | ස්ථිර ආදායම් මාර්ගයක් නොමැති සමාජ ආර්ථික ගැටලුවලින් පරපීඩිතව ජීවත්වන බොහෝ පුද්ගලයන්ගේ ප්‍රධාන ධනෝත්පාදන මාර්ගය ලෙස ස්වයං රැකියාවල නිරත වෙති. ඒ සඳහා අවැසි න්‍යායික හා ප්‍රායෝගික පුහුණු ක්‍රමවේදයක් නොමැති වීම හා ඔවුන්ගේ නිෂ්පාදනයන් (භාණ්ඩ හා සේවා) සඳහා වෙළඳපොළක් නොමැති වීම. |
| අරමුණ | ප්‍රජාවගේ ස්වයං රැකියා සඳහා ඇති, ඊට සෘජුව බලපාන ගැටලුව වන ස්වයං රැකියා පුහුණු පාඨමාලා සඳහා රාජ්‍ය අනුග්‍රහයෙන් උපදේශකවරුන් හා පුහුණුව සඳහා අවශ්‍ය උපකරණ, අමුද්‍රව්‍ය සපයා ගැනීමේ දුෂ්කරතාවයන් සඳහාද පාඨමාලා පැවැත්වීමට වසම තුළ ඇති රජයේ පොදු ප්‍රජා ශාලා යොදා ගැනීමෙන් ඔවුන්ගේ නිෂ්පාදනයන්අලෙවි කිරීමට සුුදුසු වෙළඳපොළක් වසම තුළ හා බාහිර සමාජය තුළ ඇති කර ඔවුන්ගේ භාණ්ඩ අලෙවි කර ජීවන මට්ටම ඉහල නංවා ගැනීමට උපකාරී වීම. |
| ක්‍රියාකාරකම | වසමේ ප්‍රජාව ස්වයං රැකියා තුළින් ආදායම් උත්පාදන මාර්ග වැඩිදියුණු කරගැනීමට හැකිවන පරිදි ඔවුන් දිරිමත් කර තරඟකාරී වෙළඳපොළට තරඟකාරී නිෂ්පාදන සමූහයක් අලෙවි කර මූලධර්ම ඔස්සේ හඳුන්වා දීමට අවශ්‍ය දැනුම ලබාගැනීමට වි.දා.තා. නිලධාරී හරහා පුහුණු අවස්ථා වැඩිකර භාණ්ඩ ප්‍රචාරණය පුළුල් කර සහන මිලට අමුද්‍රව්‍ය ලබාදී සහන පොළිය මත ණය ලබාගැනීමට අවශය පහසුකම් හා උපදෙස් කුඩා ව්‍යාපාර සංවර්ධන නිලධාරී හරහා ලබා දී රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන හරහා පුද්ගලයන් සම්බන්ධිකරණය කර පෞද්ගලික හා රාජ්‍ය වෙළඳපොළ ජය ගැනීමට අවශ්‍ය නිෂ්පාදන සඳහා භාණ්ඩ අලෙවිසැල් මාසිකව හෝ ත්‍රෛමාසිකව පවත්වා ඔවුන්ගේ ආදායම් වැඩිකර ගත හැකි පරිදි නවෝත්පාදන ශිල්ප ක්‍රම හඳුන්වා දීම.<br><br>උදා - * ග්‍රාම ශක්ති වැඩසටහන මඟින් සුළු පොළියට ණය ලබාදීම.<br>* ග්‍රාම ශක්ති වැඩසටහන මගින් පුහුණු වැඩසටහන් පැවැත්වීම (මැහුම්) |
| වගකීම | වි.දා.තා.නිලධාරී<br>කුඩා ව්‍යාපාර සංවර්ධන නිලධාරී<br>මානව සම්පත් සංවර්ධන නිලධාරී<br>වනිතා සංවර්ධන නිලධාරී<br>} ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| ප්‍රතිලාභීන් ගණන | 100 පමණ |

**08.මත්ද්‍රව්‍ය පාලනය කිරීම.**

| | |
|---|---|
| ගැටලුව | ඉලක්ක ගත කරගත් ළමා හා තරුණ පරපුර මත්ද්‍රව්‍ය සඳහා නැඹුරුවීමක් දක්නට ඇත. අඩු ආදායම් මට්ටම, සමාජය තුළින් නිරන්තරයෙන් දක්නට ලැබීම, ආර්ථික ගැටලු, ඨකවරණයේ ගැටලු, පවුල් සංස්ථාවේ පවතින ගැටලු හා පාසල් අධ්‍යාපනය අඩාල වීමේ ගැටලු වැනි බොහෝ ගැටලු මෙයට හේතුවී තිබේ. මත්ද්‍රව්‍ය වෙළඳාම් කරන්නන් හා භාවිතා කරන පිරිස් මේ සඳහා වැඩි වශයෙන් පොළඹවා ගැනිමත් දක්නට ඇත. |
| අරමුණ | මතින් තොර සමාජයක් ඇති කිරිම හා අනාගතය භාර ගැනීමට සිටින රටෙහි දූදරුවන් මත් රකුසාගෙන් බේරාගෙන යහපත් පුරවැසියන් බවට පත්කර රට සංවර්ධනය කිරීමට දායක කර ගැනීම. |
| ක්‍රියාකාරකම | පාසල් දරුවන්, පාසල් හැරගිය නිකරුණේ කාලය ගතකරන පිරිස්, ඌණ උපයෝජනයක් ඇති පිරිස් හඳුනාගෙන ස්ථාපිත මත්ද්‍රව්‍ය කමිටු හරහා ඔවුන් සඳහා පුහුණුවලත් විධිමත් රාජ්‍ය, රාජ්‍ය නොවන ආයතන හා පුද්ගලයන් සම්බන්ධ කරගෙන ක්‍රියාකාරකම් සඳහා එම පිරිස යොදා ගනිමින් දැනුවත් කිරීමේ වැඩසටහනක් ප්‍රජාව තුළ පවත්වාගෙන යාම එක් ක්‍රියාකාරකමක් ලෙස යෝජනා කළ හැකිය. පුනරුත්ථාපන මධ්‍යස්ථානවලට මත්ද්‍රව්‍ය භාවිතා කරන පිරිස් හඳුනාගෙන යොමුකිරීමත්, පසුව වෘත්තීය දැනුමක් සහිතව සමාජගත කිරීමක් කළ යුතු අතර යැපෙන්නන් වෙනුවෙන් පසුවිපරම් ක්‍රියාවලියක් සිදුකිරිමටත් ක්‍රමවේදයක් සකස් කළ යුතුය. |
| ප්‍රතිලාභින් ගණන | අවුරුදු 18ට අඩු ජනගහනය (1996) |
| වගකීම. | අන්තරායකර ඖෂධපාලක ජාතික මණ්ඩලය - පුහුණු සේවා නිලධාරී<br>ළමා හිමිකම් නිලධාරි-(ප්‍රා.ලේ.කා)<br>සමෘද්ධි සංවර්ධන නිලධාරි-(ප්‍රා.ලේ.කා)<br>ප්‍රජා පොලිස් නිලධාරි<br>ග්‍රාම නිලධාරි |

## 09.නිපුණතා සංවර්ධන හා හැකියා වර්ධන සැලැස්ම.

| | |
|---|---|
| ගැටලුව | පාසල් අධ්‍යාපනය මගහැරුණු, අතරමග අඩාල වූ හා අඩු අධ්‍යාපනික මට්ටමක් සහිත පිරිස වෘත්තීය කුසලතාවයන්ගෙන් පරිපූර්ණ නොවීම. |
| අරමුණ | පාසැල් අධ්‍යාපනය අඩාල වූ තරුණ තරුණියන්ගේ වෘත්තීය නිපුණතාවය ඉහළ නංවා උසස් ජීවන මට්ටමක් වෙත ඔවුන් ළඟා කරවීම. |
| උපාය මාර්ග | වෘත්තීය පුහුණුව හා මාර්ගෝපදේශනය සඳහා යොමුකිරීම.<br>(රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය, පෞද්ගලික අංශ යටතේ) |
| ක්‍රියාකාරකම | * වසම තුළ ඇති වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන වෙත යොමුකිරීම හෝ ආසන්න පිහිටා ඇති ග්‍රාම නිලධාරී වසමක පවත්වා ගෙන යනු ලබන වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන වෙත යොමු කිරිම.<br><br>උදා - කරගම්පිටිය ග්‍රාම නිලධාරි වසම තුළ පිහිටි<br>(1) ජාතික තරුණ සේවා සභාවේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය<br>පල්ලිදොර පාර, කවුඩාන, දෙහිවල (VTC)<br>දු.අ. 011-2761964/011 – 2731346<br><br>පවත්වනු ලබන පාඨමාලා - ඉදිකිරීම්, කළමනාකරණ, භාෂා, රූපලාවන්‍ය, මාධ්‍ය පරිගණක හා තාක්ෂණික පාඨමාලා<br><br>කාලය - පාඨමාලාව අනුව වෙනස් වේ.<br>(පූර්ණ කාලීන හා අර්ධ කාලීන)<br><br>* උසස් අධ්‍යාපනය නොලබන, නොලැබූ අය සඳහා වෘත්තීය මාර්ගෝපදේශනය සැපයීම හා උපදේශන වැඩසටහන් හරහා උපදේශනය සැපයීම.<br><br>* වෘත්තීන්වලට නව දැනුම තාක්ෂණය වර්තමානයට ගැලපෙන පරිදි යාවත්කාලීන කිරීම.<br><br>* පුහුණුවෙන් පසු රැකියාගත කිරිම හා පසුවිපරම් ක්‍රියාවලියක්ද සිදුකිරීම. |
| ප්‍රතිලාභින් ගණන | 10 |
| වගකීම | ප්‍රා.ලේ. කාර්යාලයේ කුඩා ව්‍යාපාර සංවර්ධන නිලධාරි<br>ප්‍රා.ලේ. කාර්යාලයේ නිපුණතා සංවර්ධන නිලධාරි |

## 10.කෘෂිකාර්මික සංවර්ධන සැලැස්ම.

| | |
|---|---|
| ගැටලුව | * ගෙවතු වගාවට බීජ වර්ග නොමැතිවීම.<br><br>*ගෙවතු වගාව පිළිබඳව නාගරික ජනතාවගේ දැනුම අඩු වීම.<br><br>*ගෙවතු වගාවට ඉඩකඩ ප්‍රමාණවත් නොවීම. |
| අරමුණ | *නාගරික ප්‍රජාව තුළ ගෙවතු වගාව වර්ධනය කිරීම.<br><br>*පවුල තුළින්ම කෘෂි පරිභෝජනයට හුරු කර වීම.<br><br>*මහල් නිවාසවල සිටින ප්‍රජාව ගෙවතු වගාව සඳහා නැඹුරු කිරීම. |
| උපාය මාර්ග | *අවම ඉඩම් ප්‍රමාණයකින් වැඩිම ඵලදායිතාවයක් සහිත වගා ක්‍රම හා බෝග වර්ග හඳුන්වා දීම.<br><br>*ප්‍රජාව දැනුවත් කිරීමට වගවෙ සම්බන්ධ දැනුමින් පරිපූර්ණ ආයතන හා පුද්ගලයන් වෙත යොමුකිරීම. |
| ක්‍රියාකාරකම්. | *දෙමුහුම් බීජ හඳුන්වා දීම.<br><br>*කෘෂිකර්ම උපදේශන හා කෘෂිකර්ම සංවර්ධන නිලධාරි ලවා දැනුවත් කිරීමේ වැඩසටහන් කිරීම.<br><br>*තිරස් වගාව ආරම්භ කිරීම. (Vertical Garden )<br><br>*ගෙවතු වගාකරුවන් හඳුනාගෙන ගෙවතු වගාවට සම්බන්ධ දැනුම, රෝග නිවාරණ උපක්‍රම, කාබනික පොහොර භාවිතය, වගා නඩත්තු ශිල්පීය ක්‍රම හඳුන්වා දීම.<br><br>*බොන්සායි ක්‍රමයට පැළ වගාව ආරම්භ කිරිම.<br><br>*තිරස් වගාව ආරම්භ කිරීම.<br><br>*වහලය මත/ ස්ලැබ් එක මත බඳුන්, පීලි හා බෝතල් යොදා ගෙන වගාව ආරම්භ කිරීම. |
| වගකීම | කෘ.ප.නි.ස.<br>ගොවිජන සේවා නිලධාරි<br>කෘෂිකර්ම සංවර්ධන නිලධාරි<br>සමෘද්ධි නිලධාරි<br>ග්‍රාම නිලධාරී |
| ප්‍රතිලාභීන් ගණන | 50 |

## 11.පරිසර කළමනාකරණ සැලැස්ම.

| | |
|---|---|
| ගැටලුව | අවිධිමත් ලෙස කසළ බැහැර කිරිම, අවිධිමත් ඉදිකිරීම් බහුල වීම හා කසළ බැහැර කිරීමට නියමිත පරිදි නියමිත් ස්ථාන නොමැතිවීමත් ප්‍රජාව තැනින් තැනට (කාණු/ ඇළ මාර්ගවලට) මාර්ගවලට බැහැර කිරීමත් දිනපතා නිවාසවල එකතුවන කැළිකසල නියමිත පරිදි ප්‍රවාහනය නොකිරීමත් හරහා ඩෙංගු මදුරුවන් බෝවීම මඟින් ප්‍රජාවගේ සෞඛ්‍යයට තර්ජනයත් ඇතිවිමත් කාණු ඇළ මාර්ග අවහිර වී සුළු ගංවතුර තත්ත්වයන් ඇති වීමත්ය. |
| අරමුණු | නාගරික ප්‍රජාවගේ කැළි කසල හා අපද්‍රව්‍ය නිසි කළමනාකරණයකට යටත්ව පරිසර හිතකාමී කසල බැහැර කිරීමේ ක්‍රමවේදයක් සකස් කර විධිමත් කසල ප්‍රවාහනයකට වැඩ පිළිවෙළක් සැකසීම මඟින් ප්‍රජාවගේ ඩෙංගු උවදුර අවම කරගැනීමත් සුළු ගංවතුර තත්ත්වයන් ඇතිවීම පාලනය කරගැනීමත්, මාර්ග, කාණු, ඇළ මාර්ග අපිරිසිදු කිරීම වලක්වා ගැනීමත් ජනතාවගේ සෞඛ්‍යය තත්ත්වය ඉහළ නංවා සෞඛ්‍යාරක්ෂිතව සෞඛ්‍ය සම්පන්නව ජීවත්වීමට අවස්ථාව සලසා දීම. |
| ක්‍රියාකාරකම | අදාළ රාජ්‍ය ආයතන හා දෙහි/ගල් මහ නගර සභාවේ නිලධාරින් සම්බන්ධ කරගෙන ප්‍රජාව හා එම නිලධාරීන් අතර කතිකාවතක් ඇතිතිරීම තුළින් කසල කළමනාකරණයට වැඩපිළිවෙලක් සකස් කිරිම හා ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය හරහා (MOH) නගර සභාවේ නිලධාරීන්, සේවකයන් එක්ව ප්‍රජාවගේ සහභාගිත්වයෙන් සෞඛ්‍ය අමාත්‍යංශයේ මග පෙන්වීම යටතේ ඩෙංගු මර්දන ඒකකය සමඟ නිශ්චිත වැඩ පිළිවෙලක් සකස් කිරිම මඟින් ප්‍රජාවට කසල බැහැර කිරීමට අවශ්‍ය පහසුකම් ලබාදීම පහත සඳහන් පරිදි සිදුකළ හැකිය.<br><br>(1) කැළිකසල නියමිත පරිදි වෙන්කර ප්‍රමිතිගත කර බඳුන්ගත කිරීම. (ප්ලාස්ටික්, ඉඳුල් ලෙස හෝ දිරන නොදිරන ලෙස වෙන් කළ යුතුය.)<br><br>(2) නැවත පරිහරණය කළහැකි අපද්‍රව්‍ය වෙන්වෙන්ව එකතු කිරීමට උපදෙස් ලබාදීම හෝ එක් ස්ථානයක් හෝ ආයතන හෝ පුද්ගලයන් හඳුන්වා සම්බන්ධීකරණය කිරීම.<br><br>(3) නිවාස තුලම අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීමට හැකි නම් ඒ සඳහා අවශ්‍ය උපදෙස් හා භාණ්ඩ ලබාදීම මඟින් ප්‍රජාව ඒ සඳහා හුරු කරවීම.<br><br>(4) පරිසර නිලධාරි හරහා විධිමත් ලෙස කසළ කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමට යොමුකිරීම.<br><br>(5) ECO BRICK ක්‍රමවේදයට උචිත පරිදි කැළි කසල බැහැර කිරීමට අවශ්‍ය දැන්ම උපදෙස් ලබාදීම.<br><br>(6) මාර්ග දෙපස කසළ බඳුන් ස්ථාපිත කිරීම. ( අපද්‍රව්‍ය කාණු/ ඇළ මාර්ගවලට දැමීම වලක්වා සුළු ගංවතුර තත්ත්වයන් අවම කිරීමට හැකිය)<br><br>(7) කසල රැගෙන යාමට නියමිත දිනයක් වේලාවක් ලබාදී රැගෙන යන කසල පිළිබඳ පුළුල් අවබෝධයක් ලබාදීමත්, ඒ පිළිබඳ පසුවිපරම් කිරීමටත් වග බලාගත යුතුය.<br><br>(8) වීදි හා මාර්ගවලට කමිටු පත්කර එහි නායකයින් ලෙස වසමේ ප්‍රජා නායකයින් සම්බන්ධ කරගෙන දැනුවත් කිරිමේ වැඩසටහන් සකස් කිරිම හා ශ්‍රමදාන පැවැත්වීම, අත් පත්‍රිකා බෙදිම, ගෙයින් ගෙට ගොස් දැනුවත් |

| | |
|---|---|
| | කිරීම, නිවාස පරික්ෂාව, පොදු ස්ථාන පිරිසිදු කිරිම හරහා ප්‍රජාව තුළ නිරන්තර අවධානය ඩෙංගු උවදුර කෙරෙහි යොමුකර මදුරුවන් බෝවීම වැළැක්විමට අවශ්‍ය පසුබිම ප්‍රජාව තුළ ස්ථාපිත කිරීමට උපදෙස් ලබාදීම.<br><br>(9) එමෙන්ම නගර සභාව හරහා වසම තුළ ඇති සියලුම කාණු පද්ධති පිරිසිදු කිරීමත් ජලය බැසයාමට බාධාවන අවිධිමත් ඉදිකිරීම් ඉවත් කිරීමටත් අබලන් පැති කාණු පිළිසකර කිරීමත් මදුරු ගහණ වැඩි ප්‍රදේශවලට ධූමායනය කිරීමත් මඟින් ඩෙංගු අවධානම අඩු කර ගත හැකි බවට ප්‍රජාවට ඒත්තු ගැන්වීම හා ඒ පිළිබඳව ක්‍රියාත්මක කරවීම. |
| ප්‍රතිලාභින් ගණන | වසමේ පවුල් ගණන - 1795 |
| කාලය | දිනපතා (වසර පුරා ) |
| වගකීම | දෙහි/ගල්ම.න.ස.<br>සෞඛ්‍ය අමාත්‍යාංශය<br>ආපදා කළමනාකරණ නිලධාරී(ප්‍රා.ලේ.කා)<br>ග්‍රාම නිලධාරී<br>MOH දෙහිවල |

## 12.සෞඛ්‍ය පෝෂණ ගැටලු

| | |
|---|---|
| ගැටලු | * අඩු බර සහිත ළමුන් සඳහා පෝෂණ ගැටලු ඇතිවීම.<br>* පාසැල් ළමුන්ගේ මන්දපෝෂණය සම්බන්ධ ගැටලු<br>* පෙර පාසල් ළමුන්ගේ පෝෂණය සම්බන්ධ ගැටලු<br>* ගර්භනී මවුවරුන්ගේ පෝෂණය සම්බන්ධ ගැටලු |
| අරමුණ | බල ප්‍රදේශයේ පෝෂණය සම්බන්ධ ගැටලු අවම කර නීරෝගී සෞඛ්‍යය සම්පන්න පුරවැසියන් බිහිකිරීම. |
| උපාය මාර්ග | පවුල් සෞඛ්‍ය සේවා නිලධාරි, මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරින් සම්බන්ධ කරගෙන දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරිම. |
| ක්‍රියාකාරකම | අඩු බර සහිත ළමුන්ට ත්‍රිපෝෂ ලබාදීම.<br>ගර්භනී මවුවරුන්ට පෝෂණ මල්ල ලබාදීම.<br>පෝෂණය වර්ධනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සකස් කිරීම.<br>මාතෘ සායනය සඳහා සහභාගි නොවන මවුවරුන් හා දරුවන් එයට යොමුකිරීමට පෙළඹවීම.<br>නිවැරදි පෝෂණ ගුණයෙන් යුත් ආහාර රටාවන් පිළිබඳ දැනුවත් කර ඒවාට හුරු කිරීම. |
| වගකීම | පවුල් සෞඛ්‍ය සේවා නිලධාරි<br>ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි<br>මුල් ළමාවිය සංවර්ධන නිලධාරි |
| අවශ්‍යතා | * විලවල ළමා හා මාතෘ සායනයේ සංවර්ධනය නොකළ කොටස කුට්ටිගල් අල්ලා සංවර්ධනය කිරීම.<br>*මාතෘ සායනයේ මවුවරුන් දැනුවත් කිරිමට අවශ්‍ය MULTI MEDIA SYSTEM එකක් අවශ්‍ය වීම.<br>(Computer, Projector, Screen) |

## දකුණු කොළඹ ශික්ෂණ රෝහල - කළුබෝවිල (CSTH)

**ගැටලුව**

කළුබෝවිල ශික්ෂණ රෝහලට දැඩිව බලපෑමක් ඇති කරන ගැටලුවක් වන්නේ වාහන නැවැත්වීම සඳහා ප්‍රමාණවත් ඉඩ පහසුකම් සහිත රථගාලක් නොමැතිවීමයි. වාහන රෝහල ඉදිරිපිට හා අවට සෙසු මාර්ගවල නවතා රෝගීන් බැලීමට පැමිණීම හා ප්‍රතිකාර ලබාගැනීමට පැමිණෙන නිසා රෝගීන් බලන වේලාවන්වලදී රෝහල අවට අධික මාර්ග තදබදයක් දක්නට ලැබේ. මෙමඟින් රෝහල් කාර්යය මණ්ඩලයටද විශාල ගැටලුවක් බවට පරිවර්තනය වී ඇත. රෝහලට පැමිණෙන පුද්ගලයන්ට මෙන්ම එම මාර්ග භාවිතා කරන නිවැසියන්ටද හදිසි අවස්ථාවලදි මාර්ග තදබදය හේතුවෙන් දැඩි අපහසුතාවයකට පත්විමට සිදුවේ. හදිසි අවස්ථා සඳහා කැඳවීම් කරන විට රෝහල් කාර්යය මණ්ඩලයට ද රෝහලට පැමිණීමටද විශාල කාලයක් ගතවේ. සුනන්දාරාම පාර, ඇස්.ද.ඇස්.ජයසිංහ මාවත, ද සිල්වා හරස් පාර මෙම මාර්ග තදබදයට ලක්වන ප්‍රධාන මාර්ග වේ. මෙම මාර්ග කදබදය ද විශාල කාලයක් අපතේ හැරිමට හේතු වේ.

**විසඳුම.**

රෝහලට පැමිණෙන අයට (රෝගීන්ට) හා රෝහල් කාර්යය මණ්ඩලය සඳහා වාහන නැවැත්වීම සඳහා රථගාලක් ඉදිකිරීම.

(පවතින භූමිය සීමිත වන නිසා ඇස්.ද.ඇස්.ජයසිංහ මාවතට ඉහළින් රථගාල් කිරීමට Concrete යොදා Fly over එකක් සෑදීම හෝ උමං මාර්ගයක් සෑදීම.)

**වගකීම.**

සෞඛ්‍ය අමාත්‍යාංශය

අධ්‍යක්ෂ (ද.කො. ශික්ෂණ රෝහල)

අරමුණ

විශාල කාලයක් අපතේ නොයවා ප්‍රතිකාර කිරීමටත්, ප්‍රතිකාර ලබාගැනීමටත් හැකියාව ලැබීම හා සෞඛ්‍ය සම්පන්න පුරවැසියන් බිහිකිරීම අරමුණු කරගනී.

## 13.ළමා අපයෝජනය

| | |
|---|---|
| ගැටලුව | වාර්තා වන, ඉලක්ක වයස් කාණ්ඩවල ළමුන්ට අමතරව නිරන්තරයෙන් අපයෝජනයට, හිංසනයට ලක්වන හා ලක්විය හැකි දරුවන් ප්‍රජාව තුළ සිටීමට හේතු ලෙස දෙමාපිය රැකවරණය අහිමිවීම, පවුල් සංස්ථාවේ ගැටලු, ආර්ථිකමය ගැටලු වලින් පීඩිත නාගරික වතු සංස්කෘතියක් තුළ දරුවන් ජීවත් වීම පෙන්වා දිය හැකිය. මෙය ළමා පරපුරට මෙන්ම රටේ අනාගතය භාරගන්නා දරුවන්ට වන විශාල හිරිහැරයකි. සමස්ත රටේ සංවර්ධනයට විශාල ගැටලුවකි. |
| අරමුණු | වාර්තා ගතවන අපයෝජනයට ලක්වන දරුවන් එයින් මුදවා අනාගත සුරක්ෂිතභාවය ඇති කිරිමත් අපයෝජනයට ලක්විය හැකි බාහිර සාධක සහිත පරිසරයක, සමාජයක ජීවත්වන ළමුන්හට ඒ පිළිබඳ අවබෝධ කර දී එම දරුවන් අපයෝජනයට ලක්වීමෙන් වලක්වා ගැනීමත්ය. |
| උපාය මාර්ග | දරුවන් වෙනුවෙන් ළමා සමිති පිහිටුවා ළමා සංවර්ධන සැලැස්මක් ප්‍රජාව තුළ ඇතිකර ප්‍රජා සංවිධානවල නායකයින්ගෙන් දායකත්වයෙන් වැඩිහිටි ප්‍රජාව මෙන්ම පාසල් දරුවන්ද දැනුවත් කිරීමේ වැඩසටහන් වලට යොමුකර අපයෝජනයට ලක්විය හැකි අවස්ථා පිළිබඳවත් තමන් හා නිතර ගැටෙන පුද්ගලයන්ගෙන්ද එසේ විය හැකි අවදානම පිළිබඳවත් එහි අනාගත සෝචනීය තත්වය පිළිබඳවත් අනාගතයට එක්විය හැකි කටුක අත්දැකීම් පිළිබඳවත් පුළුල් ලෙස දැන්වත් කිරීම හරහා ග්‍රාම නිලධාරි වසම තුළ එවැනි තත්ත්වයන් ඇතිවිය හැකි පසුබිම පාලනය කරගැනීමට අවැසි මාර්ගෝපදේශ ලබාදී දරුවන්ට නිදහසේ ළමා ලෝකය හිංසනයකින් තොරව ගත කිරීමට අවස්ථාව ලබාදී රටේ අනාගත පරපුර ආරක්ෂා කිරීමට පියවර ගැනීම තුළින් දරුවන් හිංසනයෙන් අපයෝජනයෙන් රැකගෙන සමාජයට දායාද කිරීම බලාපොරොත්තු වේ. |
| ක්‍රියාකාරකම | කුට්ටනයව, හිංසනයට ලක් වූ දරුවන්ගේ මානසික අවපීඩනය වලක්වා ගැනීම සඳහා මනෝ උපදේශනයට යොමුකරවීම හා පරිවාස හා ළමාරක්ෂණ අධිකාරියේ නිලධාරීන් වෙත යොමුකර සුදුසු පරිදි සමාජ ගත කිරීමට උපදෙස් ලබාදිම කළ හැකිය. වෛද්‍යවරු ලවා ළමා වැඩසටහන් ඇතිකර උපදෙස් ලබාදීමත්, පාසැල් පද්ධතිය හරහා දරුවන්ට ඇති ගැටලු ප්‍රකාශ කිරීම විෂය බාහිර ගුරුවරයෙකු පත්කර දරුවන්ගේ ගැටලුවලට හුදෙකලාව විසඳුම් සෙවීමට ඇති අවස්ථාව වළක්වා ගෙන දරුවාට අවශ්‍ය රැකවරණය පාසල් වෙතින්, දෙමාපියන් වෙතින්, පවුල තුළින් සමාජය තුළින් ඇති කිරීමට, ළමා හිංසනය, අපයෝජනය අවම කිරීමට හේතු සාධක කර ගත හැකිය. |
| ප්‍රතිලාභින් ගණන | වයස අවු.18ට අඩු ජනගහනය 1996 |
| වගකීම | ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරි (ප්‍රා.ලේ.කා)<br>මුල් ළමාවිය සංවර්ධන නිලධාරි (ප්‍රා.ලේ.කා)<br>උපදේශන සේවා නිලධාරි (ප්‍රා.ලේ.කා)<br>ග්‍රාම නිලධාරි<br>පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුව<br>පාසල්වල විදුහල්පතිවරුන්, ගුරුවරුන්<br>ප්‍රජා නායකයින් |

## 14.ග්‍රාමශක්ති ජනතා ව්‍යාපාරය - විලවල 537

ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය යටතේ සීමාසහිත 537 විලවල ග්‍රාම ශක්ති ජනතා සමිතිය ස්වාධිනව විලවල ග්‍රාම නිලධාරී වසම තුළ සමාජ, ආර්ථික, මාකව හා භෞතික සංවර්ධනය මූලික කරගෙන පිහිටුවා ගන්නා ලදී. සහභාගිත්ව සංවර්ධන ප්‍රවේශය මූලික කරගත් සංවිධානයේ නිලධාරී මණ්ඩලය එක්එක් කාර්යයන් සඳහා විශේෂ වූ කමිටු මඟින් ග්‍රාමීය සහභාගිත්ව සැලසුම් ක්‍රියාවලිය මූලික කර වසම තුළ ඇති ගැටලු හා ඒ සඳහා ලබාදිය යුතු විසඳුම් හා යෝජනා පිළිබඳව තොරතුරු රැස්කර රාජ්‍ය නිලධාරින් හා සමාගම් නිලධාරින් එක්ව ග්‍රාමීයසංවර්ධන සැලසුම් සකස් කර ඇත.

**අරමුණ**

අඩු ආදායම්ලාභීන් ස්වයං රැකියා වැඩි දියුණු කරගැනිම සඳහා සමාජ ආර්ථික සදාචාරාත්මක වැඩසටහන් තුළින් විලවල ග්‍රාමශක්ති ජනතා සමිති සාමාජික සාමාජිකාවන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම, ප්‍රජා සහභාගිත්ව වර්ධනය කිරීම අරමුණු කරගෙන තිබේ.

**ක්‍රියාකාරකම්**

2019 වර්ෂයේදී ත්‍රෛමාසික මැහුම් පාඨමාලාවන් අමුද්‍රව්‍ය ලබාදී පවත්වා සහතිකපත් ලබාදෙන ලදී.

2019 වර්ෂයේදී සාරි හැට්ට මැසීම පිළිබඳ පාඨමාලාවක් පවත්වන ලදී.

2019 වර්ෂයේදී ස්වයං රැකියා සඳහා රු.10,000/-ක ණය මුදලක් සාමාජිකයන් 42 වෙත ලබා දී තිබේ.

(එය මාසිකව අය කරගෙන යනු ලබයි)

## <u>දෙහිවල මැතිවරණ බල ප්‍රදේශය විලවල ග්‍රාම කොට්ඨාශය</u>

## <u>ආධ්‍යාත්මික හා සදාචාර ප්‍රවර්ධනය සඳහා යෝජනා මාලාව</u>

## <u>ශ්‍රී මහාවිහාරය-පාමංකඩ දෙහිවල</u>

අතිගරු ජනාධිපතිතුමාගේ 'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව නාගරික, අර්ධ නාගරික හා ග්‍රාමීය ජනතාව ඉලක්ක කර ගනිමින් ඔවුන්ගේ භෞතික සම්පත් සංවර්ධනය සිදු කරවනවා සේම ආධ්‍යාත්මික හා සදාචාර අංශයන් ප්‍රවර්ධනය කිරීම ද මූලික අපේක්ෂිතාර්ථය යි. ඒ වෙනුවෙන් අර්ධ නාගරික භාවයෙන් මිදී නාගරික පරිසරයට එකතු වීමට සැරසෙන දෙහිවල මැතිවරණ බල ප්‍රදේශයට අයත් විලවල ග්‍රාම සේවා කොට්ඨාශයේ ආධ්‍යාත්මික හා සදාචාර සංවර්ධනය සඳහා පාමංකඩ ශ්‍රී මහා විහාරස්ථානය කේන්ද්‍ර කරගනිමින් ඉදිරිපත් කෙරෙන යෝජනාවලියයි.

කොළඹ දිස්ත්‍රික්කයේ දහිවල බල ප්‍රදේශයේ විලවල ග්‍රාමසේවා කොට්ඨාශයට අයත් පාමංකඩ ශ්‍රී මහා විහාරස්ථානය දෙහිවල කොට්ඨාශයේ ඇති පැරැණිතම විහාරස්ථානයකි. මනරම් කඳු ගැටයක් මත පිහිටා ඇති මෙය කෝට්ටේ රජ දවස දක්වා අතීතයකට උරුමකම් කියන අතර පෞරාණික විහාරාරාංගයන්ගෙන් යුක්ත හරිත ගුණයෙන් පෝෂිත විහාරස්ථානයකි. මෙම විහාරස්ථානය කේන්ද්‍ර කරගෙන ප්‍රදේශයේ ආගමික, සදාචාර, සංස්කෘතික, අධ්‍යාපනික අංශ සංවර්ධනය කිරීමේ සක්‍රීය වැඩසටහන් රාශියක් ඉටු කර ගෙන යන අතර, ඒවා තවදුරටත් විධිමත් අයුරින් හා ඵලවත් අන්දමින් සිදුකිරීම විහාරස්ථානයේ අපේක්ෂාව යි.

**මේ වන විට ලංකාවේ තරුණ ප්‍රජාව (විශේෂයෙන් නාගරික) විවිධ අපචාරයන්ට ග්‍රහණය වී ඇති හා අරමුණක් නැතිව ඉච්ඡාභංගත්වයට නතු වූ කොට්ඨාශයක් බවට පත් වී ඇත. වැඩි වශයෙන් මේ ඉරණමට ගොදුරු වී ඇත්තේ සිංහල බෞද්ධ තරුණ දූ දරුවන් ය. ප්‍රේමය බිඳවැටීම ආදී මානසික අවපාතයන් නිසා වර්ෂයකට සියදිවි නසා ගන්නවුන්ගේ ප්‍රමාණය දහස් ගණනින් ගණනය වේ. මත්කුඩු ආදියට ඇබ්බැහි වී කාලකණ්ණි කරගනුයේ ඒ අයගේ තුරුණු විය පමණක් නොව අවසානයේ සමාජ පිළිලයන් බවට ද පත් වේ. බොහෝ සිංහල බෞද්ධ දරුවන්ගේ විවාහ සංස්ථාවන් දෙදරා ගොස් ඇත. මේවා සකස් කිරීමට විවේචනවලින් ඔබ්බට ගොස් ප්‍රායෝගික වැඩ පිළිවෙලක්**

**ආගමික අංශ හා වගකිව යුතු රාජ්‍ය අංශ මැදිහත් වී සිදුකිරීම මෙකල යුගයේ කාර්යභාරය වනු ඇත. ඒ සඳහා**

1. විවාහාපේක්ෂකව සිටින තරුණ තරුණියන් උදෙසා බෞද්ධ හැදියාවට හා සභ්‍යත්වයට ගැළපෙන පරිදි විවාහ උත්සව ආදිය සැලසුම් කර ගැනීමටත්, විවාහ වූ පසු සැලසුම් සහගත පවුල් ජීවිතයක් ගත කිරීමට ද හැකි වන පරිදි මාර්ගෝපදේශන සේවාවක් පවත්වාගෙන යෑම.

   **(දැනට මෙය කතෝලික පල්ලිය කේන්ද්‍රව සිදු කෙරේ. මෑතක දී වැඩිම බෞද්ධ ප්‍රජාවක් වෙසෙන 'මහරගම' ප්‍රදේශය වැඩිම කතෝලික ප්‍රජාවක් වෙසෙන 'කොච්චිකඩේ' ප්‍රදේශ දෙක කේන්ද්‍ර කරගෙන විවාහ බිඳ වැටීම් පිළිබඳව පර්යේෂණයක් සිදු කොට ඇත. ඉන් තහවුරු වී ඇත්තේ සිංහල බෞද්ධයන් අතර විවාහ 30% ක් සාර්ථක වී ඇති බවත්, කතෝලික ප්‍රජාවගේ විවාහ 95% ක් සාර්ථක වී ඇති බවත් ය. එයට හේතුව වී ඇත්තේ විවාහයට පෙර විවාහාපේක්ෂක තරුණ තරුණියන් පල්ලියට කැඳවා අනාගත ජීවිතය සැලසුම් කර ගන්නා ආකාරය පිළිබඳ උපදෙස් සැපයීමයි.)**

2. දරුඵල අපේක්ෂාවෙන් සිටින ගැබිණි මව්වරුන් කැඳවා ඒ අයට 'ආධ්‍යාත්මික මාතෘ සායන' පැවැත්වීම. **(කළුබෝවිල ශික්ෂණ රෝහල ආසන්නයේ ඇති හෙයින් මෙය වඩාත් පහසුවෙන් සිදු කළ හැක.)**

   **(බෞද්ධ වත් පිළිවෙත්වලට හුරු කරවමින් සමාජයට රටට වැඩදායී දරු පරපුරක් බිහි කරවීමට මෙය ඉමහත් රුකුලක් වනු ඇත. වර්තමානයේ මනෝවිද්‍යාඥයන් හා අධ්‍යාපන විද්‍යාඥයන් ද පරීක්ෂණ හා නිගමන මගින් තහවුරු කොට ඇත්තේ දරුවන් අධ්‍යාපනය ආරම්භ කරනුයේ මව්කුසේ දී ම බවයි. (බුදුරදුන් මෙය මීට වර්ෂ 2562 කට කලින් දේශනා කොට ඇත.)**

3. මත්වතුරට අබ්බැහිවූවන් නැවත ස්ථාපනය කිරීමේ වැඩ පිළිවෙලක් ආරම්භ කිරීම.

   **(මේ පිළිබඳව දැනටමත් ශ්‍රී සංඝමිත්තා දහම්පාසල හරහා වැඩසටහනක් ආරම්භ කොට විහාරස්ථානයේ අදියර දෙකක් සාර්ථකව නිම කොට ඇත. එය විධිමත් ලෙස කර ගැනීමට දුෂ්කරතා හා ප්‍රායෝගික ගැටළු ඇති වූ හෙයින් අතරමග ඇන හිටී ඇත. එහෙත් අවශ්‍ය පහසුකම් ලැබේ ප්‍රායෝගිකව සාර්ථක කර ගත හැකි බව අපගේ විශ්වාසයයි.)**

4. කොහුවල පොලිස් ස්ථානය හා ඒකාබද්ධව සුළු වැරැදි කරන පුද්ගලයන් පුනරුත්තාපනය කිරීම

5. ශ්‍රී සංඝමිත්තා ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ (බාලිකා නිවාසයේ) දැරියන්ගේ කුසලතා දියුණු කිරීමේ විධිමත් සේවාවක් පවත්වා ගෙන යාම හා පාමංකඩ සීමාසහිත ශ්‍රී සුචරිතාධාර උපාසික සමිතිය පිහිටුවීමේ දී ඇති කරගත් පරමාර්ථයන් සාධනය කර ගැනීමට ක්‍රියා කිරීම

6. පළාතේ බෞද්ධ තොරතුරු ඒකරාශි කිරීමේ වැඩසටහනක් ක්‍රියාවට නැංවීම.

7. සෝෂාකාරී භාවයෙන් තොර ස්වයං රැකියා ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩ සටහන් ක්‍රියාවට නැංවීම

8. මීට අමතරව තවත් ආගමික හා සදාචාර අංශයන් දියුණු කළ හැකි විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කළ හැක.

මෙම කටයුතු සිදු කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස දැනට වැසී ගොස් ඇති පාමංකඩ ශ්‍රී මහා විහාරස්ථානයේ බෝධිය ආසන්නයේ ඇති ශ්‍රී සංඝමිත්තා දහම්පාසල් ගොඩනැගිල්ල යොදා ගැනීමට අපේක්ෂා කරමු. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ සමයේ ස්වේච්ඡාවෙන් පවත්වා ගෙන ගිය පාසල් රජයට පවරා ගන්නා තෙක් එය පාලනය වූයේ පාමංකඩ විහාරස්ථානය හා ශ්‍රී සුචරිතාධාර උපාසිකා සමිතිය මගිනි. එකල මෙම ගොඩනැගිල්ල සහිත ඉඩම අයත් වී තිබී ඇත්තේ විහාරස්ථානයට යි. පිළියන්දල කලාප කාර්යාලයේ ඇති ශ්‍රී සංඝමිත්තා විද්‍යාල ලිපි ගොනුවේ 1965 වසරේ අඳින ලද බිම් සැලැස්සේ මෙම

ගොඩනැගිල්ල සහිත ඉඩම නම් කොට ඇත්තේ ද Temple land ලෙසිනි. විහාරස්ථානයේ බෝ මළුව තුළ අටවිසි බෝධි වෘක්ෂ රෝපණය කොට හරිතවත් භාවය වැඩි කොට 'අටවිසි සම්බෝධි උයනක්' නිර්මාණය කිරීමට මූලික සැලසුම් සකස් කොට ඇත. එසේ කළ පසු මෙම පරිශ්‍රය පුද්ගල ආධ්‍යාත්මික හා පෞරුෂත්ව සංවර්ධනය ක්‍රියාත්මක කිරීමට මාහැඟි හිතකර පරිසරයක් වනු ඇත. එබැවින් වැසී ගොස් ඇති අප පංසලට අයත් එම පාසල් ගොඩනැගිල්ල නැවත විහාරස්ථානය වෙත ලබා දී පංසල හරහා ගමේ ආධ්‍යාත්මික සංවර්ධනය සිදු කිරීමට පුණ්‍යවන්ත අවස්ථාව ලබාදීමට කටයුතු කරනු මැනවි.